# භික්ෂූන්වහන්සේ කාශ්‍යප රජුට විරුද්ධවීම

සීගිරි කාශ්‍යප රජතුමාගේ යක්ෂ සංස්කෘතිය සීගිරියෙන් නිරූපණය වන්නේ යැයි අපි සිතමු. ලංකාවේ ජීවත්වූ යක්ෂ ගෝත්‍රිකයන් සමහර දෙනකු යක්ෂ ගෝත්‍රික ආගම් ඇදහූ බවට සැකයක් නැත. ඔවුන් මළ නෑදෑයන් ඇදහීම හා ඒ ආශ්‍රිත වතාවත්වල නිරතවන්නට ඇත. කොහොඹා කංකාරියෙන් ඇතැම් යක්ෂ ඇදහිලි නිරූපණය වන බව ද පැහැදිලි ය. එහෙත් ඒ අතර ඔවුන්ගෙන් ඇතමකු නිගන්ඨාගම ද අදහන්නට ඇතැයි සිතිය හැකි ය.

දඹදිව ඇතැම් ජෛන ආගමික ස්ථානවල යක්ෂ පිළිම නෙළා ඇති අතර යක්ෂ රූප ඇඳ ඇත. එල්ලෝරා ගුහාවල පවා මේ යක්ෂ පිළිම දැකගත හැකි ය. ඉන්ද්‍ර හා ඉන්ද්‍රානි යන යක්ෂ හා යක්ෂණී රූප ඒ අතර විශේෂ තැනක් ගනියි. යක්ෂ ගෝත්‍රික නායකයන් බොහෝ විට මහාවීර හා වෙනත් නිගන්ඨ මුනිවරුන්ගේ ආරක්ෂකයන් ලෙස  පිළිම අඹා තිබෙනු දැකිය හැකි ය. මෙයින් කියැවෙන්නේ ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් නිගන්ඨාගම ඇදහූ බව යැයි පිළිගත හැකි ය.

පර්සියාවට බටහිරින් වූ ප්‍රදේශයකින් හෝ බටහිර පර්සියාවෙන් හෝ දඹදිවට හා ලංකාවට පැමිණි යක්ෂ ගෝත්‍රිකයන් ගෙන් ඇතැම් අය නිගන්ඨාගම පිළිගත්තේ යැයි සිතිය හැකි ය. බුදුන් වහන්සේගේ කාලයෙහි දඹදිව සිටි මහාවීර මුනි විසිඅටවැනි ජෛන මුනිවරයා යැයි කියනු ලැබේ. ඒ කෙසේ වෙතත් ජෛනාගම බුද්ධදහමට වඩා පැරණි බව පෙනී යයි. ආර්යයන්ට පෙර දඹදිවට පැමිණ ඇති යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් ජෛනාගම වැළඳගත්තා විය හැකි ය.

ලංකාවේ ද විසූ ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් ජෛනාගම අදහන්ට ඇත. පඬුඅබා රජු නිගන්ඨයන්ට ද  අනුරපුරෙන් භූමි භාගයක් වෙන්කර දී ඇති බව පෙනී යයි. මේ නිගන්ඨයන් යනු අනුරාධපුරයේ සිටි ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් විය හැකි ය. එළාර රජු ද ජෛනාගමිකයකු වූ බවට මතයක් වෙයි. ඒ රජුගේ පර්සියන් සම්භවය ද සළකා බැලූ විට පෙනී යන්නේ ඔහු යක්ෂ ගෝත්‍රිකයන් සමග සම්බන්ධකම් පැවැත් වූ ඔවුන්ගේ ආධාරය ලැබූ ජෛනාගමිකයකු විය හැකි බව ය. පර්සියාවේ ද ජෛනාගම පැතිර තිබූ බවක් මෙයින් නො කියැවෙයි. එළාර රජු ලංකාවට පැමිණීමෙන් පසුව මෙරට ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් අනුව යමින් ජෛන ආගම වැළඳ ගන්නට ඇත.

වළගම්බා රජු පළමුවර යුද්ධයෙන් පැරදී පළා යන විට ගිරි නම් නිගන්ඨයා මහා කළු සිංහලයා පැන යන්නේ යැයි උද්දාමයෙන් කෑ ගසා ඇත. මේ නිගන්ඨයා ද යක්ෂ ගෝත්‍රිකයකු වීමට ඉඩ ඇත. මෙහි දී තවත් කරුණක් අවධාරණය කළ යුතුව ඇත. මහා කළු සිංහලයා පළා යන්නේ යැයි නිගන්ඨයා කෑ ගැසුවේ ඇයි? සාමාන්‍යයෙන් සිංහලයන් කළු වීම තේරුම් ගත හැකි ය. මෙහි පැමිණි අර්ධ වෛදිකයන් තළඑළළු හෝ තරමක සුදු පැහැයෙන් යුක්ත වන්නට ඇත. ඒ අතර බටහිර පර්සියාවෙන් හෝ එයටත් බටහිරින් හෝ පැමිණි යක්ෂ ගෝත්‍රිකයන් එයට ද වඩා සුදු වන්නට ඇත.

මහා කළු සිංහලයා පැන යන්නේ යැයි කෑ ගැසූ නිගන්ඨයා බටහිර පර්සියාවෙන් පැමිණ ජෛනාගම වැළඳ ගත් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන්නකු වීමට ඉඩ ඇත. යක්ෂ ගෝත්‍රිකයන් කළු වී ය යන්න දඹදිව ඇතිකරන ලද මතයක් විය හැකි ය. ආර්යයන් දඹදිවට පැමිණ වර්ණභේදය වපුරන විට යක්ෂ ගෝත්‍රිකයන්ගෙ සමේ පැහැය කුමක් වුවත් ඔවුන් ද කාළ වර්ණ ගණයට දමා සමාජයේ පහත් තැනක් දී ඇති බව පෙනෙයි.

දඹදිවට පැමිණ වෛදික සංස්කෘතියක් ඇතිකළ ආර්යයන් යක්ෂ ගෝත්‍රිකයන්ගේ හා අන් අයගෙ දෙවියන් ද පහතට ඇද දමා තමන්ගේ දෙවියන් උඩට ගෙන ඇති බව පැහැදිලි ය. යක්ෂ ගෝත්‍රිකයන් ගෙ දෙවියන් එහි දී ඇතැම්විට යක්ෂයන් නමින් හඳුන්වනු ලැබ ලෝකයට අවැඩක් කරන පිරිසක් ලෙස ප්‍රචාරය කෙරී ඇත. මේ පිළිබඳ විශේෂ අධ්‍යයනයක් කරන අයකුට බොහෝ කරුණු දැනගත හැකිවනු ඇත.

කෙසේ වෙතත් යක්ෂ සම්බන්ධයක් ඇති ව උපන් කාශ්‍යප කුමරු ථෙරවාදයට එතරම් හිතවත් කමක් දක්වා ඇති බවක් නො පෙනෙයි. එහෙත් ඔහු මහසෙන් රජු මෙන් නොව ථෙරවාදයට එරෙහිව ක්‍රියාකර නො මැත. ඔහු සීගිරිය අසළ විහාරයක් කරවා ඒ ධම්මරුචික භික්ෂූන් වහන්සේට පූජා කර ඇත. එයට පෙර ඉසුරුමුණිය ප්‍රතිසංස්කරණයෙන් පසු

© Prof. Nalin De Silva

මහාවිහාරික භික්ෂූන් වහන්සේට පූජාකළ අවස්ථාවේ දී උන්වහන්සේ රජු පීතෘඝාතක යැයි කියා එ ප්‍රතික්ෂේප කර ඇත. එවිට රජු එ බුදුන් වහන්සේට පූජා කර ඇත.

පීතෘ ඝාතක වුවා හෝ නොවුවා හෝ ථෙරවාදී මහාවිහාරය හා කාශ්‍යප රජු අතර ප්‍රශ්නයක් තිබූ බව පැහැදිලි ය. එහෙත් එතුමාට ජනතාවගේ අකමැත්තක් නොතිබූ බව ද නිසැක ය. කලින් ද සඳහන් කර ඇති පරිදි මුගලන් කුමරුට මෙරට සේනා සංවිධාන කරගත නො හැකි විය. එමෙන් ම කාශ්‍යප රජුගේ ඇමතිවරු ලෙස සේවය කළ බොහෝ අය වූහ. මුගලන් කුමරු ආපසු පැමිණ රජවීමෙන් පසුව මේ ඇමතිවරුන්ට වධ හිංසා පමුණුවා මරා දැමී ය. ඔහු රකුසකු මෙන් ක්‍රියාකළ බව වංසකතාව කියයි.

මුගලන් කුමරු ආපසු පැමිණීමෙන් පසුව ද ජනතාව ඔහුට පක්ෂපාති වූ බවක් නො පෙනෙයි. කාශ්‍යප රජුගේ සේනාව මුගලන් කුමරුගේ කුලී සේනාව සමග සටනට ගොස් ඇත. වංසකතාව අනුව කාශ්‍යප රජුට සටනේ දී මහා මඩ වගුරක් වළකා යෑම සඳහා ඇතු ආපසු හැරවීමට සිදු වී ඇත. එ දුටු කාශ්‍යප රජුගේ සේනා රජු පළා යන්නේ යැයි සිතා බිඳී ගොස් ඇත. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් මුගලන් කුමරුගේ සේනා කාශ්‍යප රජුගේ සේනා ලුහු බැඳ ගොස් පරාජය කර ඇත.

මේ සියළු කරුණුවලින් පෙනී යන්නේ මහාවිහාරික භික්ෂූන් වහන්සේ හැරෙන්නට අන් භික්ෂූන් වහන්සේ ද ගිහියන් ද කාශ්‍යප රජුට විරුද්ධ වී නොමැති බව ය. කාශ්‍යප රජු පීතෘඝාතක වී ද යන ප්‍රශ්නය මෙහි දී නොනගා නොසිටිය හැකි ය. කාශ්‍යප රජුට පීතෘ ඝාතනයට හවුල් වී යැයි කියැවෙන, නැතහොත් කාශ්‍යප රජු එ සඳහා උසිගැන්වී යැයි කියන මිගාර සෙනෙවි මුගලන් රජුගේ අවසරය ගෙන අභිෂේක ප්‍රතිමාවෙහි අභිෂේකය කළ බව සඳහන් වෙයි. මෙහි තරමක පරස්පරයක් වෙයි.

කාශ්‍යප රජු අනුව ගියේ යැයි කියමින් ඇමතිවරුන්ගේ කන්නාසා කප්පවමින්, ඔවුන් රටෙන් නෙරපා දමමින්, විනාශ කරමින් කටයුතු කළ මුගලන් රජු මිගාර සෙනෙවියන්ට එවැනි අවසරයක් දුන්නේ කෙසේ ද? මේ වෙනත් මිගාර සෙනෙවියෙක් ද? එසේත් නැතහොත් මිගාර සෙනෙවි රජුට හසු නොවී පළාගොස් පසුව රජු සන්සුන් වූ පසු ආපසු පැමිණ මිත්‍ර වී ද? එ කුමක් වුවත් කාශ්‍යප රජුට පක්ෂ වූ විශාල පිරිසක් එකල සිටි බව පැහැදිලි ය.

අපට තීරණය කිරීමට සිදු වී ඇත්තේ භික්ෂූන් වහන්සේ කාශ්‍යප කුමරු රජවීමට අකමැති වීමට හේතුව කුමක් ද යන්න ය. එ හුදෙක් පිතෘ ඝාතක සිද්ධිය විය නො හැකි ය. එ එසේ නම් තවත් බොහෝ දෙනා කාශ්‍යප කුමරුට විරුද්ධ විය යුතු ය. ඇතැම් විට රජු පිතෘ ඝාතක නොවුවා විය හැකි ය. කලින් සඳහන් කළ මිගාර සෙනෙවි කාශ්‍යප කුමරු තම පියා මැරවීමට උසිගැන්වූ තැනැත්තා නම් කිසි කලෙක ඔහුට මුගලන් රජුගෙන් සමාව ලැබේවි යැයි සිතිය නො හැකි ය.

මහාවිහාරික භික්ෂූන් වහන්සේ පමණක් කාශ්‍යප කුමරුට විරුද්ධ වීමෙන් පෙනී යන්නේ කුමරු පීතෘ ඝාතක වුවත් භික්ෂූන් වහන්සේ ඔහුට විරුද්ධ වූයේ එ නිසා ම පමණක් නොවන බව ය. අපට සිතාගත හැකි ආකාරයට භික්ෂූන් වහන්සේ කාශ්‍යප කුමරුට විරුද්ධවීමට ප්‍රධාන හේතුව ඔහු ථෙරවාද බෞද්ධයකු නො වීම ය. අනෙක් බොහෝ දෙනාට නොතේරුණ ද රාජ්‍ය පාලකයා ථෙරවාද බෞද්ධයකු වීමේ වැදගත්කම එ වන විටත් භික්ෂූන් වහන්සේ දැන සිටින්නට ඇත. එ වන විට ථෙරවාද බුදුදහම රැකීම සිංහල බෞද්ධයන්ගේ කාරයභාරය බව මහාවිහාරික භික්ෂූන් වහන්සේ තීරණය කර තිබුණි.

සිංහල බෞද්ධයන්ගේ ඉතිහාසයෙහි වැදගත් ම සිද්ධියක් වන ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථ පාලි භාෂාවට පරිවර්තනය කෙරුණේ මහානාම රජු දවස ය. එ ක්‍රිතුවසින් 410- 432 කාල පරිච්ඡේදයෙහි ය. ආන්ද්‍ර ප්‍රදේශයෙහි වැඩ විසූ ථෙරවාද භික්ෂූන් වහන්සේ සමග වූ කතිකාවතකින් පසුව ථෙරවාදය ආරක්ෂා කිරීම සඳහා ග්‍රන්ථ පාලි භාෂාවට පරිවර්තනය කිරීමට තීරණය කරන ලද්දේ යැයි අපි සඳහන් කෙළෙමු. මේ තීරණයෙහි වැදගත්කම සමග රජු ථෙරවාදී බෞද්ධයකු විය යුතුය යන්න භික්ෂූන් වහන්සේගේ අදහස වන්නට ඇත. එහෙත් මේ අදහස ගිහියන් අතරට එකල ම ගියේ යැයි සිතිය නො හැකි ය.

© Prof. Nalin De Silva

ලංකාවට පළමු දෙමළ ආක්‍රමණය සිදු වී ඇත්තේ ඉන් ටික කලකට පසුව ය. පණ්ඩු පාරින්ද ආදී රජවරු ඉන් නොබෝ කලකින් ක්‍රිතුවසින් 433 දී ම අනුරාධපුරයේ බලය අල්ලා ගෙන ඇත. ඒ සත් රජවරුන් පරාජය කට ධාතුසේන කුමරු රජ වුයේ ක්‍රිතු වසින් 459 දී ය. කාශ්‍යප කුමරු රජ වී ඇත්තේ ක්‍රිතු වසින් 477 දී ය. සිංහලයාගේ කාර්යභාරය ථෙරවාද බුදු සසුන රැකීම ය යන්න හෝ රජු ථෙරවාද බෞද්ධයකු විය යුතු ය යන්න හෝ ජනතාව අතරට යැමට එකල වන විට කාලයක් නොවී යැයි සිතිය හැකි ය. එබැවින් ඒ කරුණ මහාවිහාරික භික්ෂුන් වහන්සේට (ථෙරවාදී භික්ෂුන් වහන්සේට) පමණක් සීමා වී යැයි සිතීම නිවැරදි ය.

කාශ්‍යප කුමරු ඇතැම්විට ථෙරවාදී නොවන වෙනත් බෞද්ධයකු වන්නට ඇත. එහෙත් ථෙරවාදය ලෝකයෙන් ම තුරන් වී යැමේ අනතුර දැනසිටි මහාවිහාරික භික්ෂුන් වහන්සේට ඒ ප්‍රමාණවත් නොවී යැයි සිතිය හැකි ය. යම්කිසි අයුරකින් එදා ථෙරවාදය ලංකාවෙන් අභෝසි වී ගියේ නම් එහි තේරුම වන්නේ ඒ ලෝකයෙන් ම තුරන් වීම ය. එබැවින් මහාවිහාරික භික්ෂුන් වහන්සේ ථෙරවාද නොවන බෞද්ධයකුට වුවත් අකමැති වීම පුදුමයක් නො වේ. හැරත් උන්වහන්සේට මහසෙන් රජුගේ උදාහරණය ද තිබුණි. ක්‍රිතුවසින් තුන්වැනි සියවසේ අවසාන කාර්තුවේ රජකළ ථෙරවාදී නොවූ මහසෙන් රජු මහාවිහාරය සමතලා කර උඳු වැපිරවී ය.

අනෙක් අතට කාශ්‍යප කුමරු ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් අනුගමනය කරමින් ජෛනාගමිකයකු වන්නට ද ඉඩ ඇත. සීගිරියෙහි ඇති යක්ෂ ගෝත්‍රික හා පර්සියානු සංස්කෘතික ලක්ෂණ මෙහි දී  අපේ අවධානයට ලක්විය යුතු ය. කාශ්‍යප රජු කුවේරයා මෙන් ජීවත්වීමට  සීගිරිය නිර්මාණය කරන්නට ඇතැයි යන මතය මෙහි දී අපේ මතකයට නැගීම පුදුමයට කරුණක් නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva